සියලුම හිමිකම් ඇවිරිණි.

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - SP**

අ. පො. ස. (උසස් පෙළ) තෙවන වාර පරීක්ෂණය - 2021
**G. C. E. (Adv. Level) - Third Term Test - 2021**

| | | | | | |
|---|---|---|---|---|---|
| සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II | 23 | S | II | 13 ශ්‍රේණිය | කාලය පැය 03 යි |

**ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

1. සන්නිවේදනය සාර්ථකව තේරුම් ගැනීමට ඊට අදාළ මූලික කරුණු පිළිබඳ අවබෝධය වැදගත්වේ.
   (i) සන්නිවේදනය පිළිබඳ විල්බර් ශ්‍රාම් ආචාර්යවරයා ඉදිරිපත් කළ නිර්වචනය ලියන්න. (ලකුණු 4)
   (ii) පුද්ගලාන්තර සන්නිවේදනයේ ප්‍රයෝජන දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 8)
   (iii) සන්නිවේදන ස්වරූප හතරක් නම් කර ඉන් දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 12)
   (iv) සන්නිවේදනයේ කාර්ය හතරක් රූපවාහිනී මාධ්‍ය යේ ක්‍රියාත්මක වන ආකාර නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 16)

2. යහපත් සමාජයක් ගොඩනැගීමට ජනමාධ්‍යයට සිදු කළ හැකි කාර්ය අසීමිතය.
   (i) රූපවාහිනී මාධ්‍යයේ නිර්මාණශීලී වැඩසටහන් වර්ග හතරක් නම් කරන්න. (ලකුණු 4)
   (ii) ගුවන්විදුලි මාධ්‍ය සඳහා භාෂාව භාවිතා කිරීමේදී අවධානයට ගත යුතු කරුණු හතරක් නම් කර ඉන් දෙකක් සඳහා නිදසුන් සපයන්න. (ලකුණු 8)
   (iii) සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම හතරක් නම් කර එහි වැදගත්කම් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 12)
   (iv) සමාජ මාධ්‍ය තරුණ සමාජයේ යහපතට හා අයහපතට බලපාන ආකාරය නිදසුන් දෙක බැගින් ඉදිරිපත් කරමින් විස්තරාත්මක රචනයක් ලියන්න. (ලකුණු 16)

3. සන්නිවේදනය ක්‍රියාවලියකි. එය සෑම ආයතනයකම කළමනාකරණ ක්‍රියාවලියට උපකාර වේ.
   (i) හැරල්ඩ් ලැස්වෙල් ආකෘතියෙහි පවතින විශේෂතා හතරක් නම් කරන්න. (ලකුණු 4)
   (ii) කිසියම් ආයතනයක මහජන සම්බන්ධතා ක්‍රියාවලියට අයත් පාර්ශව හතරක් දක්වා ඉන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 8)
   (iii) දැනුම් සමාජය නිර්මාණය වීමට සන්නිවේදන අධ්‍යයනය ඉවහල් වූ ආකාරය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 12)
   (iv) සන්නිවේදන අධ්‍යයන විෂය ශාස්ත්‍රීය ලෙස හැදෑරීමේ අවශ්‍යතාව පිළිබඳ කරුණු හතරක් පදනම් කරගෙන රචනයක් ලියන්න. (ලකුණු 16)

4. ජනමාධ්‍ය සහ සංස්කෘතිය අතර ඇත්තේ අවියෝජනීය සබඳතාවයකි.
   (i) සංස්කෘතිය පිළිබඳ ඊ.බී. ටයිලර් ගේ නිර්වචනය ලියන්න. (ලකුණු 4)
   (ii) ජනප්‍රිය සංස්කෘතියේ ලක්ෂණ හතරක් නම් කර ඉන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 8)
   (iii) සංස්කෘතිය කෙරෙහි ජනමාධ්‍යයේ බලපෑම කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 12)
   (iv) උසස් මාධ්‍ය සාක්ෂරතාවයක් අත් කර ගැනීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන තුනක් ඇසුරු කරගෙන විස්තරාත්මක රචනයක් ලියන්න. (ලකුණු 16)

5. මාධ්‍ය සාක්ෂරතාව ඇතිකර ගැනීමෙන් මාධ්‍ය විචාරයට හා නිර්මාණාත්මක චින්තනයට මඟ හදා ගත හැකිය.
   (i) මාධ්‍ය විචාරයට අදාළ අංග හතරක් නම් කරන්න. (ලකුණු 4)
   (ii) විචාරශීලි ග්‍රාහකත්වය කෙරෙහි බලපාන කුසලතා හතරක් නම් කර ඉන් දෙකක් කෙටියෙන් පහදන්න. (ලකුණු 8)
   (iii) නිර්මාණාත්මක සන්නිවේදනයේ අවශ්‍යතාවය හා වැදගත්කම කරුණු තුනක් ඇසුරින් පහදන්න. (ලකුණු 12)
   (iv) සන්නිවේදන කාර්යයේ දී ජනශ්‍රැති හා ජනකලා නිර්මාණශීලීව භාවිත කළ හැකි ආකාරය වර්තමාණ නිර්මාණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 16)

6. ආයතනික කළමනාකරණ ක්‍රියාවලියට මහජන සම්බන්ධතාව අත්‍යවශ්‍ය වේ.

(i) මහජන සම්බන්ධතාවට අදාළව එඩ්වඩ් එල් බර්නීස් ගේ හෝ චාල්ස් ප්ලැකාඩ් ගේ නිර්වචනය ලියන්න. (ලකුණු 4)

(ii) මහජන සම්බන්ධතාව අවශ්‍යවන අවස්ථා හතරක් නම් කර ඉන් දෙකක් පහදන්න (ලකුණු 8)

(iii) මහජන සම්බන්ධතා මෙවලම් හා විධික්‍රම විවිධ ආයතන යොදා ගන්නා ආකාරය උදාහරණ මඟින් පහදන්න. (ලකුණු 12)

(iv) සිද්ධි කළමනාකරුවෙකුගේ භූමිකාව හා කාර්ය කරුණු හතරක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 16)

7. සංවර්ධනය සඳහා ජනමාධ්‍යයේ වැදගත්කම අත්‍යවශ්‍ය සාධකයකි.

(i) සංවර්ධනය පිළිබඳ මතවාද ඉදිරිපත් කළ විද්වතුන් හතර දෙනෙකු නම් කරන්න. (ලකුණු 4)

(ii) සංවර්ධන සන්නිවේදන සංකල්පයට අයත් මාතෘකා දෙකක් නිදසුන් මගින් පහදන්න. (ලකුණු 8)

(iii) මාධ්‍ය නියාමනයේ අවශ්‍යතාව කරුණු තුනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) ලෝකයේ මාධ්‍ය නියාමනය සඳහා භාවිතා කරනු ලබන මූලික ප්‍රවේශ හතර නම්කර ඉන් කරුණු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 16)